ජාතික ඉතිරිකිරීමේ බැංකුව - 2015

----------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන හා බැංකුවේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන එම පරිපාලිතයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3)සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය - බැංකුව

----------------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය - සමූහය

------------------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර) වලට අනුකූල වීම

--------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් එකතුව රු. මිලියන 42.47 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ විවිධ හේතුන් මත පසුව අත්හැර දමා තිබුණි. කෙසේවුවද, ඒ සඳහා දරන ලද පිරිවැය වියදමට අයකර නොතිබුණි. තවද ඒ සඳහා දරන ලද වියදම ඵලරහිත වියදමක් ලෙස දැක්විය හැක.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 200,000 ක් වැය කර අත්පත්කර ගන්නා ලද පර්චස් 28.14 ක ප්‍රමාණයකින් යුත් මහියංගණයේ ඉඩම් දෙකක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලි 2 ක් රු. මිලියන 1.6 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද, එම ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නිම කරන ලද ශාඛා 06 ක නවීකරණයන් සඳහා බැංකුව රු. මිලියන 13.6 ක් දරා තිබුණි. කෙසේවුවද, මෙම වියදම අදාළ ගිණුම්වලට ප්‍රාග්ධනිත කර නොතිබුණි.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අක්‍රීය ගිණුම් මත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. මිලියන 716 ක මුදලින්, රු. මිලියන 442.3 ක මුදලක් අය කර ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) **2015 දෙසැම්බර් 31 දිනට වංචනික ආපසු ගැනීම් රු. මිලියන 94.3 ක් හිඟ හිට පැවති අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය රු. මිලියන 67.8 කින් හෙවත් සියයට 256 කින් වැඩි වී තිබුණි. බැංකුවේ තොරතුරු තාක්ෂණ පාලන පද්ධතියේ දුර්වලතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස අනවසරයෙන් දත්ත ලබා ගැනීම මඟින් ප්‍රධාන වශයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයෙන් වංචනිකව මුදල් ආපසු ගැනීම් හේතුවෙන්, එම වැඩිවීමෙන් රු.මිලියන 43 ක මුදලක් හෙවත් සියයට 162 ක් දරා තිබුණි.**

(ඇ) **තැන්පතු නිෂ්කාෂණ ගිණුම්වල දැක්වෙන රු. මිලියන 2.7 ක ශේෂය නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.**

(ඇ) **2015 දෙසැම්බර් 31 දිනට මුදල් අයකැමිගේ අතිරික්තය රු. මිලියන 1.45 ක් වූ අතර ඉන් රු. මිලියන 1.4 ක් හෙවත් සියයට 97 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.**

**2.2.4 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.**

| නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 47 වගන්තිය | වර්ෂ 10 කට වැඩි කාලයක් අක්‍රියව පවත්නා තැන්පතු "හිමිකම් නොපෑ තැන්පතු සංචිත" ගිණුමට මාරු කළ යුතුය. කෙසේවුවද, එම ගිණුමට මාරු කිරීමෙන් තොරව රු. මිලියන 1435.72 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අක්‍රීය ලෙස පැවතුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, 2015 වර්ෂයේදී බැංකුවේ සේවකයන් වෙනුවෙන් රු. මිලියන 134.84 ක් වූ උපයන විට ගෙවීම් බදු (PAYE) සාමුහික ගිවිසුම ප්‍රකාරව බැංකුව විසින් එහි අරමුදල් වලින් ගෙවා තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය ඉදිරිපත් කළ යුතු වුවද, පසුගිය වර්ෂ 5 ක් සඳහා වාර්ෂික අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී එයට අනුකූල වී නොතිබුණි. |

(ඇ) 2006 ඔක්තෝබර් 05 දින අංක 06 මඟින් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.8.4 මාර්ගෝපදේශය

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) පත්කළ යුතු වුවද මාර්ගෝපදේශයට පටහැනිව පහත සඳහන් මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණ ඇගයීම් කමිටුව පත්කර තිබුණි.

* රු. මිලියන 6.82 ක වටිනාකමට වානේ අල්මාරි හා කැබිනට් මිලදී ගැනීම.

* රු. මිලියන 4.25 ක් වටිනා "Firewall" පද්ධතිය මිලදී ගැනීම.

* රු. මිලියන 8.43 කට ශාඛා හා අංශ සඳහා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම.

* රු. මිලියන 12.37 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම.

(ii) 2.12 මාර්ගෝපදේශය

සියලු ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් ඒවායේ පළමු රැස්වීමේදී නියමිත ආකෘති ප්‍රකාශනයක අත්සන් තැබීම අවශ්‍ය වන අතර, එම ප්‍රකාශන වර්ෂ 5 ක කාලයක් සඳහා සුරක්ෂිතව තබා ගත යුතුය. කෙසේවුවද, ශාඛා හා අංශ සඳහා රු. මිලියන 6.8 ක්, රු. මිලියන 4.25 ක් හා රු. මිලියන 8.43 ක් වටිනා පිළිවෙලින් වානේ අල්මාරි හා කැබිනට්, ෆයර්වෝල් පද්ධතිය හා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීමේදී එයට අනුකූල වී නොතිබුණි.

(iii) 8.9 මාර්ගෝපදේශය

රු. 500,000 කට වැඩි වටිනාකමක් සහිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතුය. එසේ වුවද, පහත සඳහන් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

* 2015 සිංහල/ දෙමළ හා හින්දු අලුත් අවුරුද්ද සඳහා රු. මිලියන 33.1 ක් වටිනා ත්‍යාග භාණ්ඩ මිලදී ගැනීම.

* රු. මිලියන 6.89 කට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 05 ක් මිලදී ගැනීම.

* රු. මිලියන 12.37 කට කාර්යාල උපකරණ මිලදී ගැනීම.

| | |
|---|---|
| (iv) **8.12.3** මාර්ගෝපදේශය | සපයන ලද භාණ්ඩ නියමිත පිරිවිතරයන්ට හා වෙනත් එකඟ වූ කොන්දේසි වලට අනුකූල වන බවට කාර්යභාර නිලධාරී විසින් සහතිකයක් නිකුත් කළ යුතුය. කෙසේවුවද, **2015** වර්ෂයේ සිංහල/ දෙමළ හා හින්දු අලුත් අවුරුද්ද සඳහා මිලදී ගත් රු. මිලියන **33.1** ක් වටිනා ත්‍යාග භාණ්ඩ වලට අදාළව මෙයට අනුකූල වී නොතිබුණි. |
| (ඉ) බැංකුවේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ **7.1.2 (i)**වගන්තිය | බැංකු ස්කන්ධ කළඹෙන් සියයට **10** කට වැඩි ප්‍රමාණයක් කිසිදු සමාගමක ආයෝජනය නොකළ යුතුය. කෙසේවුවද, එක්තරා වානිජ බැංකුවක හා කල්බදු සමාගමක **2015** දෙසැම්බර් **31** දිනට ආයෝජනය කරන ලද රු. මිලියන **2,088** ක ආයෝජන සම්බන්ධයෙන් එයට අනුකූල වී නොතිබුණි. |
| (ඊ) **2007** ජුනි **26** දිනැති අංක **507/ 2001** දරන සාමාන්‍යාධිකාරීගේ චක්‍රලේඛයේ **19** පරිච්ඡේදය හා බැංකුවේ උකස් අත්පොතේ **14.2** පරිච්ඡේදය | * කාර්යමණ්ඩලයට දෛනික පදනම මත දෙනු ලබන උකස් අත්තිකාරම් සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පැවැත්විය යුතුය. කෙසේවුවද, ප්‍රධාන කාර්යාල ශාඛාවේ එවැනි ලේඛනයක් දෛනිකව යාවත්කාලීන කිරීමේ පදනම මත පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.<br><br>* චක්‍රලේඛයේ **'A'** ඡේදය අනුව කාර්යාල මණ්ඩල සාමාජිකයකුට වර්ෂයකට උපරිම **3** තුන්වරක් පමණක් උකස් අත්තිකාරම් ලබා ගත හැකි වේ. කෙසේවුවද, නියැදි විගණන පරීක්ෂණයේදී තෝරාගත් ශාඛා **4** ක කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා රු. මිලියන **4.86** ක උකස් අත්තිකාරම් අවස්ථා **3** කට වැඩියෙන් මුදා හැර තිබූ බව අනාවරණය විය.<br><br>* උකස් තැබීම සඳහා භාණ්ඩ ඉදිරිපත් කරන අවස්ථාවේදී එක් එක් උකස් භාණ්ඩය පුද්ගලිකව පරීක්ෂා කිරීම හා ලබාදිය හැකි අත්තිකාරම් මුදල තීරණය කිරීම උකස් කළමනාකරුගේ වගකීම වේ. කෙසේවුවද, වැල්ලවත්ත හා ප්‍රධාන කාර්යාලයේ ශාඛා විගණනයේදී අවස්ථා කිහිපයකදී උකස් භාණ්ඩ කැරට් **18** ට අඩු බව අනාවරණය විය. |

| | |
|---|---|
| (උ) **2005 ජූලි 18 දිනැති අංක 614/ 2005 දරන සාමාන්‍යාධිකාරීගේ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය** | බැංකු ඇපකරය රු. මිලියන 1 ක් ඉක්මවන්ගේ නම් සියයට 1 ක (1%) වාර්ෂික කොමිස් මුදලක් අයකළ යුතුය. කෙසේවුවද, එක්තරා රක්ෂණ සමාගමක් වෙනුවෙන් දින 270 ක කාලයක් සඳහා නිකුත් කරන ලද රු. මිලියන 1,010.55 ක් වටිනා අංක HOB/LG/2015/03 දරන බැංකු ඇපකරය මත සියයට 0.25 ක් පමණක් අයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 13,034 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 10,472 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 2,562 ක් හෙවත් සියයට 24 ක වර්ධනයක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ පරිපාලිතයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 253 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 307 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 54 ක පිරිහීමක් දැක්වුණි.

බැංකුවේ අගය එකතු කිරීමේ ප්‍රකාශනය අනුව, 2015 වර්ෂයේ අගය එකතු කිරීම රු. මිලියන 25,886 ක් වූ අතර 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 19 ක වැඩිවීමක් එයින් දැක්වුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-----------------------------------

#### 3.2.1 ලාභදායීත්වය
---------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශාඛා 174 ක, තැපැල් ශාඛා 12 ක, අංශ 04 ක හා ප්‍රධාන කාර්යාලයේ ලාභය එකතුව රු.මිලියන 16,907 කින් හා ශාඛා 59 ක හා අංශ 1 ක පාඩුවේ එකතුව රු. මිලියන 1,436 කින් සමන්විත සමාලෝචිත වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 13,034 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ රු. මිලියන 77,890 ක ආදායමට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ සමස්ත ආදායම රු. මිලියන 79,282 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සමස්ත ආදායමේ රු. මිලියන 1,392 ක් හෙවත් සියයට 1.8 ක වැඩි වීමක් එයින් දැක්වුණි.

#### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත
---------------------------------

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ආංශික අනුපාතයන් සමඟ පහත දැක්වේ.

| | | ආංශික අනුපාත * | 2015 | 2014 |
|---|---|---|---|---|
| (අ) | ලාභදායීත්ව අනුපාත | | | |
| (i) | සාමාන්‍ය කොටස් අයිතිකරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (ප්‍රතිශතය) | 14.58 | 31.5 | 30.2 |
| (ii) | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) (ප්‍රතිශතය) | 2 | 1.6 | 1.5 |
| (iii) | පොලී ආන්තිකය | 3.6 | 3.32 | 3.0 |
| (iv) | සේවක පිරිවැය (රු.මිලියනවලින්) | 6,853 | 5,910 | 4,797 |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා | | | |
| (i) | මුළු වත්කම්වලට ස්කන්ධය (වාර ගණන) | | 26.16 | 33.51 |
| (ii) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා - පෙළ I (අවම 5%) | 21.97 | 17.83 | 20.46 |
| (iii) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා - පෙළ II (අවම 10%) | 20.35 | 16.34 | 18.96 |
| (ඇ) | ක්ෂණික වත්කම් අනුපාතය | | | |
| | ද්‍රවශීලතා අනුපාතය (ප්‍රතිශතය) | 69.42 | 81.08 | 91.5 |

* ආංශික අනුපාත සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික සංඛ්‍යා ලේඛන පිළිබඳ වර්ෂ 10 ක සාමාන්‍යය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පෙර වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (ROA) සහ ශුද්ධ වත්කම් ආන්තිකය පිළිවෙලින් සියයට 6.66 කින් හා සියයට 10.66 කින් වැඩි වී තිබුණද, 2015 වර්ෂයේ එම සාමාන්‍යයන් කර්මාන්තයේ සාමාන්‍යයට වඩා අඩු වී තිබුණි.

- 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ද්‍රවශීලතා අනුපාතය සියයට 11.38 කින් අඩු වී තිබූ අතර එය කර්මාන්තයේ සාමාන්‍යයට වඩා ඉතා වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 බැංකුවේ කාර්යසාධනය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ මෙහෙයුම් කාර්යසාධනය පහත දැක්වේ.

| දර්ශකය | 2015 | 2014 |
|---|---|---|
| ---------- | ------ | ------ |
| ශාඛා සංඛ්‍යාව | 245 | 236 |
| ගිණුම් හිමියන් සංඛ්‍යාව (මිලියන) | 18.9 | 18.3 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 271 | 260 |
| පාසැල් බැංකු ඒකක | 2,287 | 2,287 |
| නියෝජිත තැපැල් කාර්යාල හා උපතැපැල් කාර්යාල සංඛ්‍යාව | 4,063 | 4,063 |

සමාලෝචිත වර්ෂය තුළ නව ශාඛා 9 ක් විවෘත කර තිබූ අතර, ගිණුම් හිමියන් සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 0.6 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 260 සිට 271 දක්වා වැඩි වී තිබුණි.

4.2 ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම - 2013 සහ 2014 වර්ෂ
-----------------------------------------------------------------

2012 දෙසැම්බර් 19 දිනැති අංක 12/1767/504/163 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධනය සඳහා ණය ලබා දීමේ අරමුණින් එජඩො මිලියන 1,000 ක්වූ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් එහි අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2013 වර්ෂයේදී බැංකුව විසින් එජඩො මිලියන 750 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර හා 2014 වර්ෂයේදී එජඩො මිලියන 250 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර පිළිවෙලින් වර්ෂයට සියයට 8.875 ක හා සියයට 5.15 ක පොළී අනුපාතයට නිකුත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට හා බැංකුවේ දීමනා කොන්දේසි ලියකියවිල්ලට (Offering Memorandum) අනුව, එජඩො මිලියන 750 ක්වූ බැඳුම්කර මුදල්වලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල, සියයට 25 ක් එක්සත් ජනපද ඩොලර් නාමික ණයවල හා සියයට 25 ක් ශ්‍රී ලංකා රුපියල් නාමික ණයවල ආයෝජනය කිරීම සඳහා නියෝග කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයෙන් කරනු ලැබේ.

i. එජඩො මිලියන 750 කින් සියයට 50 ක ශේෂය ඩොලර් නාමික ණයවල හා සමාන කොටසක් රුපියල් නාමික ණය වල වියපැහැදම් කළ යුතු වුවද පිළිවෙලින් එජඩො මිලියන 104.43 ක් හා එජඩො මිලියන 13,669.05 ක් පමණක් වියපැහැදම් කර තිබූ අතර ඉතිරි කොටස භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි.

ii. බැංකුවේ දීමනා කොන්දේසි ලියවිලිවල (Offering Memorandum) අවශ්‍යතාවන් සැලකීමෙන් තොරව 2014 වර්ෂයේදී නිකුත් කරන ලද බැඳුම්කරවල සමස්ත මුදල භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි.

4.3 නව ශාඛා ඉදිකිරීමේ ප්‍රමාදය
-----------------------------------

2011 වර්ෂයේ සිට පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ බම්බලපිටිය,ගල්කිස්ස හා මීගමුවෙහි ශාඛා 03 ක් ඉදිකිරීම ඇතුළත් කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දක්වාත් ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වර්ෂයේදීත් එම ශාඛා පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම වෙනුවෙන් රු. 44,452,000 ක කුලියක් ගෙවීමට සිදු වී තිබුණි. කෙසේවුවද, නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී ඉදිකිරීම් වැඩ නිම කළේ නම් එසේ ගෙවන ලද කුලිය ඉතිරි කර ගත හැකිව තිබුණි.

## 4.4 ණය පරිපාලනය

### 4.4.1 මුළු ණය හා අත්තිකාරම් සහ අක්‍රීය ණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ ලබාදුන් මුළු ණය හා අත්තිකාරම් සහ අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ණය වර්ගය | 2015 දෙසැම්බර් 31 දිනට තත්ත්වය | | | | 2014 දෙසැම්බර් 31 දිනට තත්ත්වය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණය හා අත්තිකාරම් | | අක්‍රීය ණය | | මුළු ණය හා අත්තිකාරම් | | අක්‍රීය ණය | |
| | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල |
| | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන |
| අලංකාර ණය | 118 | 107 | 6 | 5 | 97 | 83 | 8 | 5 |
| වාහන ණය | 9,280 | 648 | 520 | 44 | 9,516 | 787 | 299 | 30 |
| වාණිජ ණය | 1 | 1,000 | 1 | 1,000 | 1 | 1,000 | - | - |
| හුවමාරු (Commuted) ණය | 1 | 3,163 | - | - | - | - | - | - |
| විදේශීය ණය | 223 | 374 | 42 | 68 | 243 | 364 | 49 | 73 |
| රජයේ ණය | 41,612 | 27,113 | 845 | 452 | 36,454 | 24,257 | 1,154 | 651 |
| නිවාස හා දේපල ණය | 30,494 | 24,636 | 2,325 | 1,394 | 30,344 | 23,080 | 3,117 | 1,623 |
| නි.දේ ණය - මිහිඳු | - | - | - | 1 | 3 | 2 | 2 | 1 |
| ජා.නි.ස ජන සෙවණ | 8 | 3,627 | - | - | 7 | 3,576 | - | - |
| ඇපකරු සහතිකය මත පුද්ගලික ණය | 95,913 | 35,394 | 4,127 | 549 | 60,051 | 13,539 | 3,047 | 355 |
| උකස්මත පුද්ගලික ණය | 152 | 146 | 18 | 21 | 165 | 143 | 29 | 36 |
| ව්‍යාපෘති ණය | 51 | 79,917 | - | - | 66 | 79,418 | 1 | 30 |
| සේවක ණය | 9,745 | 3,918 | - | - | 18,072 | 4,309 | - | - |
| සේවක වාහන ණය | 521 | 380 | - | - | 400 | 141 | - | - |
| විශ්වවිද්‍යාල සේවක නිවාස ණය | 378 | 348 | 6 | 6 | 291 | 263 | 12 | 11 |
| සේවක යතුරුපැදි ණය | - | 1 | - | - | 29 | 2 | - | - |
| දිරි පියස | - | 3 | - | - | 14 | 4 | - | - |
| රට ඉතුරු ණය | 329 | 31 | - | 6 | 742 | 46 | 498 | 26 |
| වෙනත් | - | - | - | - | 1 | 1,414 | - | - |
| එකතුව | 188,826 | 180,806 | 7,890 | 3,546 | 156,496 | 152,428 | 8,216 | 2,841 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය අවසානයට රු. මිලියන 180,806 ක් වූ ණය පහසුකම් බැංකුව විසින් ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 3,546 ක් 2015 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ශේෂයන් ලෙස දක්වා තිබුණි.

(ආ) 2015 වර්ෂය අවසානයට මුළු ණය වටිනාකමින් සියයට 2 කින් අක්‍රීය ණය වටිනාකම නියෝජනය වේ.

### 4.4.2 අක්‍රීය ණයවල කාල විශ්ලේෂණය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, බැංකුවේ 2015 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය පිළිබඳ කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

| ණය වර්ගය | කාල විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂ 1 දක්වා | වර්ෂ 1 සිට 3 දක්වා | වර්ෂ 3 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අලංකාර ණය | 3.82 | 1.06 | 0.36 | - | 5.24 |
| ඔටෝ ණය | 43.99 | - | - | - | 43.99 |
| වාණිජ ණය | - | - | 1,000 | - | 1,000 |
| විදේශීය ණය | 36.58 | 25.44 | 5.94 | - | 67.95 |
| රජයේ ණය | 415.08 | 32.68 | 2.67 | 1.64 | 452.08 |
| නිවාස හා දේපල ණය | 1,011.39 | 198.79 | 86.90 | 97.00 | 1,394.09 |
| ඇප මත පුද්ගලික ණය | 491.25 | 42.83 | 7.06 | 7.41 | 548.55 |
| උකස්මත පුද්ගලික ණය | 3.55 | 10.30 | 2.67 | 4.81 | 21.33 |
| විශ්වවිද්‍යාල සේවක නිවාස ණය | 5.70 | - | - | - | 5.70 |
| මිහිඳු ණය | - | 1.20 | - | - | 1.20 |
| රට ඉතුරු ණය | 0.64 | 0.54 | 0.22 | 4.78 | 6.18 |
| එකතුව | 2,012.00 | 312.84 | 1,105.82 | 115.64 | 3,546.31 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය මුදලින් රු. මිලියන 1221.47 ක් හෙවත් සියයට 34 ක් වර්ෂ 3කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) වර්ෂ 3 සිට 5 දක්වා කාල පරිච්ඡේදයක අක්‍රීය ණය වලින් සියයට 90 ක් වූ රු. මිලියන 1,000 ක් එක්තරා සංවිධානයකට ලබා දී තිබූ වාණිජ ණයකින් නියෝජනය විය.

(ඇ) වර්ෂ 5 කට වැඩි කාලයක් අක්‍රීය ණය බවට පත් වූ නිවාස ණය රු. මිලියන 97 ක් වූ අතර එය වර්ෂ 5 කට වැඩි මුළු අක්‍රීය ණය වලින් සියයට 84 කින් නියෝජනය විය.

(ඈ) "රට ඉතුරු ණය" වල මුළු අක්‍රීය ණය ශේෂයෙන් සියයට 77 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

### 4.4.3 වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ සේවක ණය

වැඩ තහනම් කළ, සේවය අතහැර ගිය, සේවයෙන් ඉල්ලා අස්වූ හා සේවයන් ඉවත් කළ නිලධාරීන් 44 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.මිලියන 4.64 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු. මිලියන 1,337.49 ක් වූ සේවක ණය තුළ ඇතුළත් වී තිබුණි.

### 4.4.4 ව්‍යාපෘති ණය

නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා සියයට 20 ක පොලී අනුපාතයට 1996 වර්ෂය තුළ දී පුද්ගලික සමාගමකට ලබා දී තිබූ රු. මිලියන 50 ක් හා රු. මිලියන 30 ක් වූ පිළිවෙලින් ණය මුදල් දෙකකට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 1999 ජූලි මාසය වන විට මෙම ණය මුදල සම්පූර්ණයෙන් නිරවුල් කර ගැනීමට අපේක්ෂා කර තිබුණද, ණය මුදලේ එක් වාරිකයක් හෝ ගෙවීමෙන් තොරව සම්පූර්ණ ණය මුදල හිඟ හිට පැවතුණි.

ii. ඉහත සඳහන් ණය මුදල්වලට අදාළව 2004 නොවැම්බර් 06 දිනට බැංකුවට ගෙවන ලද පොලී මුදල පිළිවෙලින් රු. මිලියන 8.52 ක් හා රු. මිලියන 1.55 ක් විය.

iii. 2006 මාර්තු 10 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, ණය මුදල යොදා ගනිමින් අත්කරගත යුතු ඉඩම් ප්‍රමාණය අක්කර 6, රූඩ් 3 ක් සහ පර්චස් 21.75 ක් විය. කෙසේවුවද, අදාළ තක්සේරු වාර්තා හා මැනුම් වාර්තා අනුව ඉඩමේ ප්‍රමාණය අක්කර 6 රූඩ් 2 පර්චස් 12.8 ක් විය. එබැවින් රූඩ් 1 පර්චස් 8.95 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

iv. රු. මිලියන 184 ක් වටිනා ඉහත දේපළවල කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවරා ගෙන තිබූ අතර රු. මිලියන 113 ක් වටිනා ඉඩම බැංකුවට අයත් විය. කෙසේවුවද බැංකුව විසින් ලබා ගන්නා ලද තක්සේරු වාර්තාව අනුව, ඉඩමේ තථ්‍ය වටිනාකම රු.මිලියන 70.3 ක් පමණක් වූ අතර ඒ අනුව රු. මිලියන 42.7 ක මුදලක් ලබා ගැනීමට නොහැකි විය.

v. රු. මිලියන 13.3 ක් වටිනා ඉහත ඉඩම්වල කොටස් 03 ක් 2008 ජූනි 02 දිනැති අංක 1604/16 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ දැන්වීමක් ප්‍රසිද්ධ කිරීම මඟින් රජය විසින් අත්පත් කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු වන්දි මුදලක් 2015 වර්ෂය අවසානය දක්වා බැංකුවට ලැබී නොතිබුණි.

### 4.4.5 උකස් අත්තිකාරම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ලබා දෙන ලද මුළු උකස් අත්තිකාරම් ප්‍රමාණය රු.මිලියන 26,489 ක් වූ අතර එහි වෙළඳපොළ වටිනාකම රු. මිලියන 37,838 ක් විය. ඉන් රු. මිලියන 5,484 ක් 2015 දෙසැම්බර් 31 දිනට අක්‍රීය උකස් ණය අත්තිකාරම් වලින් නියෝජනය වේ. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී, වෙළඳපොළේ රන්මිල සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් උකස් අත්තිකාරම් වටිනාකම හා එහි වෙළඳපොළ වටිනාකම පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 18 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීය උකස් අත්තිකාරම් මත රු. මිලියන 380 ක මුදලක් ලියා හැර තිබුණි.

(ආ) බැංකුවේ උකස් අත්පොත් 14.2 ඡේදය අනුව, කැරට් 18 ට අඩු කිසිදු රන් භාණ්ඩයක් ශාඛාවලට භාර ගැනීමට ඉඩ දී නොමැත. කෙසේවුවද, තෝරාගත් ශාඛා 04 ක කරන ලද භෞතික සත්‍යාපනයේදී කැරට් 18 ට අඩු රන් භාණ්ඩ මත රු.මිලියන 3.8 ක අත්තිකාරම් ලබා දී තිබූ බව අනාවරණය විය.

4.5 වංචනික ස්වභාවයේ ගනුදෙනු
---------------------------------

අභ්‍යන්තර පාලන ක්ෂේත්‍රයන්හි දුර්වලතා හේතුවෙන් බදුල්ල, බණ්ඩාරවෙල, රාගම, රත්නපුර, පොතුවිල් හා කොච්චිකඩේ ශාඛාවල සිදු කරන ලද විමර්ශනයන්හිදී එකතුව රු. මිලියන 204.44 ක් වූ උකස් අත්තිකාරම් ණය සඳහා ව්‍යාජ භාණ්ඩ හා අඩු කැරට් ප්‍රමාණයේ රන් භාණ්ඩ භාර ගැනීම, ස්ථාවර තැන්පතු වලට එරෙහිව අවිධිමත් ලෙස ණය ලබාදීම, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර වලින් වංචනික ලෙස මුදල් ලබා ගැනීම, අවිධිමත්ව ශේෂ සනාථ කිරීම් නිකුත් කිරීම, මිය ගිය පුද්ගලයන්ට අයත් ස්ථාවර තැන්පතු වලින් වංචනිකව ආපසු ගැනීම් ආදී වංචනික ස්වභාවයේ ගනුදෙනු නිරීක්ෂණය විය.

4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------

ඉඩම් 8 ක නීත්‍යානුකූල අයිතිය බැංකුවට ලබා ගැනීමෙන් තොරව එම ඉඩම්වල බැංකුව විසින් රු. මිලියන 83.6 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණි.

4.7 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජනවාරි 29 දින බැංකුව විසින් මිලදී ගන්නා ලද වැතම් වීදියේ රු. මිලියන 35 ක් වටිනා හෙක්ටයාර් 0.479 ක ප්‍රමාණයකින් යුත් ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කරගෙන තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබූ අතර, වන්දි ගෙවීම සඳහා පරීක්ෂණය 2012 ජුනි 28 දින සිදු කර තිබුණි. වන්දි හා ඒ සඳහා පොලී ගෙවීම පරීක්ෂණ දිනයේ තක්සේරුව මත ගෙවිය යුතු බව කොළඹ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් කිසිදු වන්දි මුදලක් ලැබී නොතිබුණි.

(ආ) බැංකුව සඳහා මහල් 18 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ සිට රු. මිලියන 35.23 ක මුදලක් වැය කර තිබුණි. මෙම ප්‍රදේශය දැඩි ආරක්ෂක කලාපයක් යටතට ගැනෙන බැවින් පෙර වර්ෂ තුළදී කිසිදු ඉදිකිරීමක් සිදු කිරීමෙන් තොරව මෙය 2015 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. එබැවින් ඒ සඳහා දරන ලද වියදම ඵලරහිත වියදමක් ලෙස දැක්විය හැක.

(ඇ) සැලසුම් අංක 2007/43 දරන ජුලියානා හෝටලය අසල ඉඩම රු. මිලියන 82 ක ආරම්භක ගෙවීමක් හා වර්ෂ 50 ක කල්බදු කාල පරිච්ඡේදයක් සඳහා රු. 1,000 ක වාර්ෂික බිම් කුලියක් ගෙවීම මඟින් ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, ඉඩමේ වටිනාකම රු. මිලියන 94.30 ක් වූ අතර මේ දක්වා උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණි.

**4.8** ආයෝජන

**------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මිල ප්‍රකාශිත සමාගම් 46 ක කොටස්වල ආයෝජනයන්ගේ සමස්ත පිරිවැය රු. මිලියන 7,390.44 ක් විය. මෙයින් සියයට 34.28 ක් නියෝජනය වන රු. මිලියන 2,534.03 ක මුදලක් දිගුකාලීන පදනම මත මිල ප්‍රකාශිත සමාගම් 3 ක ආයෝජනය කර තිබුණි. මිල ප්‍රකාශිත සමාගම් 46 කින් සමාගම් 41 ක කොටස්වල වෙළඳපොළ අගය 2015 වර්ෂය තුළදී රු. මිලියන 1,414.26 කින් හීන වී තිබූ අතර සමාගම් 5 ක පමණක් කොටස්වල වෙළඳපොළ අගය රු. මිලියන 994.31 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව, ආයෝජනය කරන ලද සමස්ත කොටස්වල වෙළඳපොළ අගය 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 419.95 කින් හීන වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ අගය හීන වූ ආයෝජනවල පිරිවැය රු. මිලියන 4,741.88 ක් වූ අතර එය සමස්ත ආයෝජන පිරිවැයෙන් සියයට 64 කින් නියෝජනය විය.

(ආ) සන්නිවේදන සමාගමක හා පුද්ගලික වාණිජ බැංකුවක කරන ලද රු. 1,747,487,382 ක ආයෝජනයන් මත සාමාන්‍ය ලාභාංශ ප්‍රතිලාභය (පසුගිය වර්ෂ 5 සඳහා) පිළිවෙලින් සියයට 2.14 ක හා සියයට 4.56 ක අඩු රේටවලින් නියෝජනය විය.

(ඇ) සමාගම් 16 ක කරන ලද රු. මිලියන 1,362.97 ක ආයෝජනයන් මත ලාභාංශ 2015 වර්ෂයේදී ලැබී නොතිබුණු අතර එය ඉහත සඳහන් මිල ප්‍රකාශිත සමාගම් 46 ක කරන ලද සමස්ත ආයෝජන වලින් සියයට 18.44 කින් නියෝජනය විය.

(ඈ) පසුගිය වර්ෂ 4 කට වැඩි කාලයක් සඳහා ලාභාංශ නොලැබුණු සමාගම් 4 ක් තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 4 හි ආයෝජන පිරිවැය රු. මිලියන 200.06 ක් විය.

(ඉ) වෙළඳපොළ අගය අඛණ්ඩව පිරිහීමට භාජනය වී තිබූ මිල ප්‍රකාශිත සමාගම් 5 ක කරන ලද ආයෝජනයන් මත කිසිදු ලාභාංශ ආදායමක් වර්ෂ 3 කට වැඩි කාලයක් ලැබී නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම සමාගම්වල ආයෝජන පිරිවැය රු.මිලියන 668.09 ක් විය. එදිනට එම ආයෝජනවල වෙළඳපොළ අගය පිරිහීම රු. මිලියන 409.55 ක් විය.

(ඊ) 2014 වර්ෂය තුළදී රු. මිලියන 48.16 කින් මිල ප්‍රකාශිත සමාගම් 2 ක වෙළඳපොළ අගය පිරිහී තිබුණද, බැංකුව විසින් 2015 වර්ෂය තුළ දී ද රු. මිලියන 8.75 ක ආයෝජනයක් කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම සමාගම්වල ආයෝජන පිරිවැය රු. මිලියන 237.26 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එම සමාගම්වල වෙළඳපොළ අගය පිරිහීම රු. මිලියන 51.85 ක් විය.තවද, 2015 වර්ෂය තුළදී මිල ප්‍රකාශිත සමාගම් 11 ක කරන ලද නව ආයෝජනයන් රු. මිලියන 645.04 ක් වූ අතර ඉන් සමාගම් 10 ක වෙළඳපොළ අගය 2015 වර්ෂය තුළ දී රු. මිලියන 95.70 කින් හීන වී තිබුණි. ඒ අනුව, අගය පිරිහී තිබුණු කොටස්වල සමස්ත ආයෝජන පිරිවැය රු. මිලියන 640.39 ක් වූ අතර එය 2015 වර්ෂය තුළදී කරන ලද රු. මිලියන 645.04 ක සමස්ත නව ආයෝජන වටිනාකමින් සියයට 99 කින් නියෝජනය විය.

(උ) 1974 ජුලි 01 දින බැංකුව විසින් එක්තරා සමාගමක රු. මිලියන 0.13 ක් වූ ස්කන්ධ සුරැකුම්පත් 20,000 ක ආයෝජනය කර තිබුණු අතර 2010 වර්ෂය අවසානය දක්වා මෙම ආයෝජනයෙන් ලැබී තිබුණු මුළු ලාභාංශ ප්‍රමාණය රු. මිලියන 0.94 ක් පමණක් විය. ඉන්පසු කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

**4.9** මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 4,113 ක් වූ අතර බැංකුව විසින් ස්ථිර පදනම මත සේවකයින් 2,813 ක් සහ විධායක ශ්‍රේණියේ තනතුරු 6 ක්, අධීක්ෂණ ශ්‍රේණියේ එක් තනතුරක්, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ තනතුරු 681 ක් සහ කනිෂ්ඨ ශ්‍රේණියේ 135 ක් ඇතුළත් සේවකයින් 823 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත 2015 වර්ෂය තුළ සේවයේ යොදවා තිබුණි.

(ආ) පසුගිය වර්ෂ 5 තුළ එක් සේවකයකුට කාර්ය මණ්ඩල පිරිවැය පහත පරිදි අඛණ්ඩව වැඩි වී තිබුණි.

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| | | | | | රු. 000 වලින් |
| එක් සේවකයෙකුට කාර්ය මණ්ඩල පිරිවැය (මුළු කාර්ය මණ්ඩල පිරිවැය/ සේවක සංඛ්‍යාව) | 1,626 | 1,429 | 1,430 | 1,303 | 1,264 |

(ඇ) තථ්‍ය සේවක සංඛ්‍යාවෙන් තනතුරු 2009 ක් හෙවත් සියයට 55 ක් බැංකු සහායක තනතුරු වලින් නියෝජනය වූ අතර එවැනි තනතුරු සඳහා බඳවා ගැනීම් පරිපාටියක් ලෙස 2005 වර්ෂයට පෙර අනුගමනය කරන ලද තරඟකාරී විභාගය වෙනුවට 2005 වර්ෂයෙන් පසුව බැංකුව සම්මුඛ පරීක්ෂණ පදනම පමණක් අනුගමනය කර තිබුණි. විභාගය පදනම වීමේදී අයදුම්කරුවන් වයස අවුරුදු 28 ට අඩු විය යුතු අතර සම්මුඛ පරීක්ෂණයට තෝරා ගැනීම සඳහා තරඟකාරී විභාගය සමත් විය යුතුව තිබුණි. කෙසේ වුවද, සම්මුඛ පරීක්ෂණය පමණක් පදනම් වීමේදී කළමනාකරණය විසින් සපයන ලද ලැයිස්තුවෙන් අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. තවද, නව පරිපාටිය යටතේ වයස් සීමාව අවුරුදු 25 ට අඩු කර තිබුණු අතර විවෘත දැන්වීම් ප්‍රසිද්ධ කිරීම හා තරඟකාරී විභාග පැවැත්වීම අහෝසි කර තිබුණි. එබැවින් නව බඳවාගැනීම් පරිපාටිය ඇතිකිරීමත් සමඟ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට තිබූ සමාන අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

**4.10** වෙළඳපොළ කොටස

බැංකු කර්මාන්තයේ තැන්පතු හා ණය සහ අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස බැංකුවේ වෙළඳපොළ කොටසට අදාළ විස්තර පහත පරිදි වේ.

| වෙළඳපොළ කොටස | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| තැන්පතු | 10.77 | 11.51 | 11.51 | 12.20 | 13.38 |
| ණය හා අත්තිකාරම් | 5.65 | 5.59 | 4.52 | 4.66 | 4.50 |

තැන්පතුවලට අදාළ වෙළඳපොළ කොටස පසුගිය වර්ෂ 5 තුළ අඛණ්ඩව අඩුවී තිබුණද, ණය හා අත්තිකාරම් සඳහා වෙළඳපොළ කොටස 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී පමණක් අඩු වී තිබුණි.

**4.4** කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ පහත සඳහන් ඉලක්ක සම්පූර්ණයෙන් හෝ කොටසක් සමාලෝචිත වර්ෂය තුළ දී ඉටුකර ගෙන නොතිබුණි.

| ඉලක්ක පිළිබඳ විස්තර | වාර්ෂික ඉලක්කය | ඉටුකර ගැනීම | ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස ඉටු කර ගැනීම |
|---|---|---|---|
| **01** ශාඛා කළමනාකරණ | | | |
| තැන්පතු සචලීකරණය වැඩි දියුණු කිරීම. | | | |
| (i) 2015 වර්ෂය වන විට තැන්පතු පදනම රු. බිලියන 635 ක් ඉටුකර ගැනීමේ ඉලක්කයට ළඟාවීම සඳහා තැන්පතු සංචලීකරණය කාලීන තැන්පතු | රු. මිලියන 40,800 | රු. මිලියන 20,280 | 50 |
| (ii) ශාඛා නැවත ස්ථානගත කිරීම | ශාඛා 9 | ශාඛා 4 | 44 |
| (iii) "දිරිය" ණය වැඩි කිරීම | ණය 4800 | ණය 596 | 12 |
| (iv) බැංකුවේ අක්‍රීය ණය අනුපාතය පවත්වා ගැනීම. | | | |
| අ සමස්ත | සියයට 4 | සියයට 5.38 | |
| ආ උකස් | සියයට 5.11 | සියයට 20 | අක්‍රීය ණය අනුපාත |
| ඇ වාහන ණය | සියයට 1.5 | සියයට 7.27 | ඉලක්කය ඉක්මවා |
| ඇ නිවාස ණය | සියයට 3.0 | සියයට 3.85 | තිබුණි. |
| ඉ පුද්ගලික ණය | සියයට 2.0 | සියයට 2.27 | |
| (v) රු. 1,000 ට අඩු ඉතිරි කිරීම් ගිණුම් ශේෂය එක් එක් ශාඛාව විසින් සියයට 50 බැගින් වැඩි කිරීම. | සියයට 50 කින් ශේෂය වැඩි කිරීම | සියයට 6 | 12 |
| **02** තැපැල් බැංකු ගිණුම් මෙහෙයුම් | | | |
| * වෙනත් තැන්පතු මඟින් සචලීකරණය | | | |
| * පෝස්ටල් ස්මයිල් | 500 | 204 | 41 |
| * තැපැල් හපන් | 300 | 152 | 51 |
| * ස්ත්‍රී තැපැල් ඉතුරුම් | 100 | 75 | 75 |
| * පෝස්ටල් අවුරුදු වාසනා | 50 | 9.57 | 19 |

| | | | | |
|---|---|---|---|---|
| **03** | ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් | | | |
| (i) | විදේශ මුදල් තැන්පතු සවලීකරණය | රු. මිලියන 2,250 | රු. මිලියන 1,003 | 45 |
| (ii) | මහජනතාව හා අපේක්ෂිත සංක්‍රමික ශ්‍රමිකයන් අතර දැනුවත් කිරීම ඇති කිරීම. | වැඩසටහන් 40 ක් පැවැත්වීම | නොපවත්වන ලදී. | නැත |
| **04** | ඒකාබද්ධ ණය ලබාදීම හා ව්‍යාපෘති මූල්‍යායනය | | | |
| (i) | ශුද්ධ වැඩිවීම | මිලියන 37,717 | මිලියන 21,793 | 58 |
| (ii) | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (බැඳුම්කර 1 මුදලින් විය පැහැදම) | එජඩො මිලියන 60.05 | එජඩො මිලියන 34.65 | 58 |
| (iii) | රුපියල් ණය (බැඳුම්කර 1 මුදලින් විය පැහැදම) | රු. මිලියන 3,500 | රු. මිලියන 1,408.02 | 40 |
| **05** | පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | |
| (i) | අලෙවිකරණය/ විකුණුම් ශිල්පීයක්‍රම/ හරස් විකුණුම් | 8 | 4 | සියයට 50 |
| (ii) | විදේශ පුහුණු (සහභාගීත්ව සංඛ්‍යාව) | 44 | 16 | සියයට 36 |
| **06** | විගණනය හා සුපිරික්සුම | | | |
| (i) | හදිසි විගණනය | 47 | 24 | සියයට 51 |
| (ii) | තොරතුරු පද්ධති විගණනය | 10 | සම්පූර්ණ කර නැත | නැත |

(ආ) 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති පහත සඳහන් ඉලක්කයන් කළමනාකරණය විසින් පසුව අවලංගු කර තිබුණි.

ඉලක්කයේ විස්තරය

**01.** ශාඛා කළමනාකරණය

(අ) පවුල් ඉතිරිකිරීම් ගිණුම් හඳුන්වා දීම.
(ආ) ඉතිරි කිරීම් ඒකක විවෘත කිරීම.
(ඇ) නිශ්චල දේපල මත වගකීම් සහතික ලිපි නිකුත් කිරීම.
(ඈ) ගාස්තු රැස් කිරීමේ පහසුකම සකස් කිරීම සඳහා ආයතන සමඟ එකඟතාවයන්ට පැමිණීම.

**02.** අලෙවිකරණ අංශය

(අ) සාමාන්‍ය පෙළ විභාගයේ දක්ෂතා දැක්වීම මත ඉතුරු මිතුරු ගිණුම් හිමියන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය
(ආ) පවුල් ඉතිරි කිරීම් ගිණුම් මත ප්‍රචාරණ ව්‍යාපාර

(ඇ) ගාස්තු පදනම් ආදායම වැඩි කිරීම සඳහා ආරම්භයන් - විභාග දෙපාර්තමේන්තුව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රේගුව, NSBM ආදීය සමඟ ගාස්තු එකතු කිරීමේ වැඩපිළිවෙලවල්

(ඈ) ඊසී කෑෂ් (Easy Cash) කාඩ්පත්‍ර සඳහා ප්‍රවර්ධනාත්මක වැඩසටහන

**03.** සිල්ලර ණයදීම

------------------

(අ) නව නිෂ්පාදනයක් හඳුන්වා දීම.

(ආ) ණය යෝජනා ක්‍රමය සමාලෝචනය

**04.** ඒකාබද්ධ ණය දීම හා ව්‍යාපෘති මූල්‍යයනය

------------------------------------------------

(ආ) ආයෝජක එකමුතුව/ සාකච්ඡා/ රැස්වීම්

(ආ) ප්‍රාදේශික විසින් ව්‍යාපෘති ණය ලබාදීම.

(ඇ) ලැයිස්තුගත ණයකර නිකුත් කිරීම.

**05.** මානව සම්පත් කළමනාකරණය

----------------------------------

මානව සම්පත් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

**5.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

අභ්‍යන්තර විගණනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා විගණන පැවරුම් 158 ක් සැලසුම් කර තිබුණද, ඉන් විගණන පැවරුම් 133 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර තිබුණි.

(ආ) 2015 වර්ෂය තුළ හදිසි විගණනයන් 47 ක් සිදු කිරීමට අභ්‍යන්තර විගණන අංශය සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ විගණනයන් 24 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

**6.** පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු, මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාවක් මඟින් සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| ---------------- | | ------------- |
| (අ) | ණය හා උකස් කටයුතු පරිපාලනය | වැඩ තහනම් කළ හා සේවය හැර ගිය සේවකයින්ගේ සේවක ණය අයකර ගැනීම පිළිබඳ කාර්ය සාධනය දුර්වල මට්ටමක තිබුණි. |
| (ආ) | නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම | අක්‍රීය ගිණුම්, වවුචර් ගොනු කිරීම, උකස් භාණ්ඩ භාර ගැනීම, පාස්පොත් ප්‍රධාන ලේඛන, පාස්පොත් තොග ලේඛන, යතුරු තැබීම, ආරක්ෂිත ලොකර් මෙහෙයුම් කිරීම, මුදල් සීමා, ඒටීඑම් කාඩ්පත් මෙහෙයුම් කිරීම, ඉල්ලීම් වවුචර්පත් සහ පිළිපත් සම්පූර්ණ කිරීම ඇතුළත් ශාඛා උපදෙස් ලේඛන, ණය පරිපාලනය, මුරවචන (password) නිශ්ක්‍රීය කිරීම, ආරක්ෂක පද්ධති ආදි ක්ෂේත්‍රයන්හි බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුකූල නොවීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය | සමහර අවස්ථාවලදී ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ස්ථාවර වත්කම් විෂයයන් සමහර ශාඛාවල භෞතිකව නොතිබුණි. මේ අතර ශාඛාවල තිබෙන විෂයයන් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (ඈ) | ගනුදෙනුකරු ගිණුම් විවෘත කිරීම හා වසා දැමීම. | ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) ආකෘති පත්‍ර, හැඳුනුම්පත් වල පිටපත්, ඉල්ලුම්කරුගේ හා නිලධාරීන්ගේ අත්සන් හා කාර්යාල මුද්‍රාව, ගිණුම් වැසීම සඳහා ලිඛිත ඉල්ලීම් නොතිබීම. |